සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය 2020** | **11 ශ්‍රේණිය** |
| **மூன்றாம் தவணைப் பரீட்சை 2020** | **தரம் 11** |
| **Third Term Test 2020** | **Grade 11** |

| | | |
|---|---|---|
| **පුරවැසි අධ්‍යාපනය** | **I** | **පැය එකයි** |
| **குடியியற் கல்வி** | **I** | **ஒரு மணித்தியாலம்** |
| **Civic Education** | **I** | ***One hour*** |

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01) ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පැහැදිලිව දක්නට ලැබෙන්නේ මින් කවර ක්‍රියාවලියක් තුළ ද?
1) පළාත් සභා මැතිවරණයක
2) පළාත් පාලන මැතිවරණයක
3) ජනමත විචාරණයක
4) පාර්ලිමේන්තු මැතිවරණයක

02) කිසිදු වෙනස්කමකට භාජනය නොකොට අයිතිවාසිකම් හා නිදහස භුක්ති විඳීම ට ඉඩ සැලසීම හඳුන්වන්නේ පහත සඳහන් කවර නමකින් ද?
1) නීතිය
2) සදාචාරය
3) යුක්තිය
4) සමානාත්මතාව

03) යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍ය දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.
1) එංගලන්තය හා ප්‍රංශය
2) එංගලන්තය හා ජර්මනිය
3) ඉතාලිය හා ප්‍රංශය
4) ඕලන්දය හා පෘතුගාලය

04) රාජ්‍යයක මූලික ලක්ෂණ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
1) ජනගහනය, ස්වාධිපති බලය, අධිකරණය, ආණ්ඩුව
2) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය
3) භූමිය, ජනගහනය, අධිකරණය, ජනාධිපති
4) ජනගහනය, ආණ්ඩුව, ජනාධිපති, විධායක බලය

05) ද්විපක්ෂ ක්‍රමයක් ඇති රටක් වන්නේ,
1) ඇමරිකා එක්සත් ජනපදයයි.
2) ඉන්දියාවයි.
3) චීනයයි
4) කියුබාවයි.

06) ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතුවක් නොවන්නේ,

1) පුනරුදය ඇතිවීමයි　　2) රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ ඇතිවීමයි

3) වැඩවසම් ක්‍රමය පවත්වාගෙන යාමයි　　4) ධනවාදී ආර්ථිකයක් ගොඩ නැගීමයි

07) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණයක් නොවන්නේ,

1) නාමික විධායකය හා සත්‍ය විධායකය (දේශපාලන විධායකය) යන අංග දෙකකින් සමන්විත වීම

2) රාජ්‍යයේ නායකයා මෙන්ම ආණ්ඩුවේ නායකයා ද වන්නේ ජනාධිපතිවරයා වීම

3) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත් වීම

4) විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබීම

08) තරගකාරි පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණය කුමක් ද?

1) ජනමත නියෝජනයට ඇති ඉඩකඩ සීමා වීම

2) ජන සමාජයේ පවතින විවිධත්වය නිරූපනය වීමට අවස්ථාව නොලැබීම

3) අන්තනෝමතික පාලනයක් බිහිවීම

4) බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩනැගීම

09) මධ්‍යම ආණ්ඩුව සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ආණ්ඩු වෙත පවරා දීම හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

1) බලය මධ්‍යගත කිරීම　　2) බලය විමධ්‍යගත කිරීම

3) බලය බෙදා හැරීම　　4) බලය ව්‍යාප්ත කිරීම

10) "විවිධත්වය තුළින් ඒකීයත්වය ළඟා කර ගැනීමට මඟ සාදන ආණ්ඩුක්‍රමය වේ."
සන්ධීය ආණ්ඩුක්‍රමය පිළිබඳ මෙම නිර්වචනය ඉදිරිපත් කරනු ලැබුවේ,

1) ඒ.වී.ඩයිසි ය　　2) කේ.සී. වියර් ය　　3) ඇරිස්ටෝටල් ය　　4) සීලර් ය

11) ඇමරිකා එක්සත් ජනපදයේ සන්ධීය ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව සතු බලතල දෙකක් අඩංගු පිළිතුර තෝරන්න.

1) මුල්‍ය කටයුතු සහ ජාතික ආරක්ෂාව　　2) අධ්‍යාපනය හා සෞඛ්‍යය

3) පළාත් පාලනය හා මහාමාර්ග　　4) සෞඛ්‍යය හා පළාත් පාලනය

12) බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන්

1) ගැටුම් වර්ධනය වේ

2) මිනිස් නිදහස සීමා වේ.

3) ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ.

4) අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය පලුදු වේ.

13) ආර්ථික භාණ්ඩයක් හා ආර්ථික නොවන භාණ්ඩයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?

1) ඇඳුම්, ඖෂධ　　2) ආහාර, හිරු එළිය

3) ජලය, වාතය　　4) හිරු එළිය, ඖෂධ

14) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධකවලට කරන ගෙවීම් පිළිවෙලින්,

1) වැටුප්, පොළිය, බදුකුලිය, ලාභය　　2) බදුකුලිය, පොළිය, ලාභය, වැටුප්

3) පොළිය, ලාභය, වැටුප්, බදුකුලිය　　4) බදුකුලිය, වැටුප්, පොළිය,ලාභය

15) පළාත් පාලන ආයතනවලට අයත් පොදු උපයෝගිතා සේවා යටතට ගැනෙන කාර්යයක් වන්නේ,

1) මංමාවත් ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම
2) පොදු කියවීම් ශාලා පවත්වාගෙන යාම
3) පොදු කානු ඉදි කිරීම, අලුත්වැඩියා කිරීම
4) අහිතකර ගොඩනැගිලි ඉවත් කිරීම

16) ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ආණ්ඩුකාරවරයා සතු කාර්යභාරයක් වන්නේ පහත පිළිතුරුවලින් කවරක් ද?

1) මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කිරීම
2) පළාත් අයවැය ලේඛනය සකස් කිරීම
3) සිය කාර්යයන් සම්බන්ධයෙන් පළාත් සභාවට සාමූහිකව වගකීම
4) පළාතේ ආර්ථික සංවර්ධන හා පරිපාලන සැලසුම් කිරීම

17) අර්ථක්‍රමයක් යනු,

1) රට තුළ නිෂ්පාදන ක්‍රියාවලිය සිදුවන ක්‍රමවේදයයි.
2) භාණ්ඩ හා සේවා මිලට ගැනීම හා පරිභෝජනය කිරීමයි.
3) භාණ්ඩ බෙදා හරින ක්‍රමවේදයයි.
4) මිනිසාට මුහුණ දීමට සිදුවන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා යම් සමාජයක් සංවිධානය වී ඇති ආකාරයයි.

18) ධනවාදී අර්ථක්‍රමයක ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

1) දේපළ අයිතිය රජය සතු වීම
2) මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය මෙහෙයවීම
3) තරගකාරී වෙළඳපොළක් පැවතීම
4) ආදායම් සමාන ලෙස බෙදී යාම

19) ගෝලීයකරණය නිසා ලංකාව මුහුණ දී ඇති ධනාත්මක බලපෑමක් නොවන්නේ,

1) දේශීය නිෂ්පාදන සාධකවලට වැඩි ඉල්ලුමක් ඇති වීම
2) සංවර්ධිත රටවලින් සිදුවන බලපෑම ඉහළ යාම
3) ගෙවුම්ශේෂ තත්වය යහපත් වීම
4) ආර්ථිකය විවිධාංගීකරණය වීම

20) පුද්ගලයා තුළ, පුද්ගලයන් අතර, පවුල තුළ, පවුල් අතර ඇතිවන ගැටුම් හඳුන්වන්නේ,

1) සාර්ව ගැටුම් ලෙසය
2) පවුල් ගැටුම් ලෙසය
3) සූක්ෂ්ම ගැටුම් ලෙසය
4) පුද්ගල ගැටුම් ලෙසය

21) ගැටුම නිරාකරණය සඳහා බේරුම්කරුවෙකු සතු විය යුතු ගුණාංග ඇතුළත් පිළිතුර තෝරන්න.

1) පක්ෂග්‍රාහී වීම, නිවැරදි තීරණ ගැනීම
2) මධ්‍යස්ථ වීම, අවිචාරශීලි බව
3) විචාරශීලි වීම, අන්තගාමී වීම
4) හොඳින් සවන් දීම, සාධාරණභාවය

22) ස්විට්සර්ලන්තයේ කැන්ටන් සතු බලතලවලට අයත් නොවන පිළිතුර තෝරන්න.

1) ආරක්ෂක හා හමුදා කටයුතු
2) පුවත්පත් පාලනය
3) බැංකු කටයුතු
4) අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය

23) රටක පාලනය නීතියේ උත්තරීතරභාවයට අනුව සිදු කිරීම හඳුන්වන්නේ,

1) ස්වාධිපත්‍ය යනුවෙනි
2) නීතියේ ආධිපත්‍ය යනුවෙනි
3) ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙනි
4) නිදහස යනුවෙනි

24) සිතීමේ හෘද සාක්ෂියේ හා ආගමික නිදහස අයත්වන මානව හිමිකම් කාණ්ඩය වන්නේ,

1) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ය.
2) ආර්ථික හා සිවිල් අයිතිවාසිකම් ය
3) දේශපාලන හා ආර්ථික අයිතිවාසිකම් ය
4) මානව හා සංස්කෘතික අයිතිවාසිකම් ය

25) ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතිය වශයෙන් සැලකෙන්නේ,

1) දණ්ඩනීති සංග්‍රහයයි
2) මානව හිමිකම් පනතයි.
3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි
4) අපරාධ නීතියයි.

26) ලංකාවේ විධායක කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක වූයේ,

1) 1921 මැනිං ආණ්ඩුක්‍රමය තුළින් ය.
2) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය තුළින් ය.
3) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළින් ය.
4) 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය තුළින් ය.

27) රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතුවක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1) රාජ්‍ය සේවය දේශපාලනීකරණය නොවීම
2) ආර්ථික හා මානව සම්පත් හිඟ නොවීම
3) රාජ්‍ය පාලනය කාර්යක්ෂම වීම
4) අල්ලස හා දූෂණය ඉහළ යාම

28) අයිතිවාසිකම් හා බැඳුණු සදාචාරාත්මක යුතුකමක් සඳහන් වන පිළිතුර කුමක් ද?

1) නීති පිළිපැදීම
2) පොදු දේපළ ආරක්ෂා කිරීම
3) සංස්කෘතිය සුරැකීම
4) රජය විසින් පනවන බදු ගෙවීම

29) සංවර්ධිත රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1) කැනඩාව, ජපානය, ප්‍රංශය
2) බෙල්ජියම, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව
3) බංග්ලාදේශය, ප්‍රංශය, බෙල්ජියම
4) ජර්මනිය, සියොරාලියෝන්, කැනඩාව

30) සාක්ෂරතාව, උපතේදී ආයු අපේක්ෂාව සහ ළදරු මරණ අනුපාතය යන සංරචක යොදා ගෙන සකස් කරනු ලබන සංවර්ධන මිණුම වන්නේ,

1) දළ ජාතික නිෂ්පාදිතය
2) භෞතික ජීවන තත්ව දර්ශකය
3) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය
4) මානව පීඩන දර්ශකය

31) තම රටේ යුක්තිය පසිඳලීමේ කාර්යය අවසන් වූ පසු ඉන් සෑහීමට පත් නොවන්නේ, නම් පැමිණිලි කළ හැකි මානව හිමිකම් කමිටුව පිහිටා ඇත්තේ,

1) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පික සම්මුතිය අනුව ය.
2) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය අනුවය.
3) ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය අනුවය.
4) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට එකතු කළ දෙවන වෛකල්පික සම්මුතිය අනුව ය.

32) බෙංගාල බොක්ක මුහුදු තීරයට අයත් රටවල් විසින් ආර්ථික සහයෝගීතාව සඳහා පිහිටුවා ගත් "බිම්ස්ටෙක්" (BIMST-EC) සංවිධානයට අයත් රටවල් දෙකක් වන්නේ,

1) ලංකාව, ජපානය
2) ඉන්දියාව, මැලේසියාව
3) ජපානය, සිංගප්පූරුව
4) ඉන්දියාව, තායිලන්තය

33) මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන පාරිසරික ගැටලු පමණක් ඇතුළත් වරණය කුමක් ද?

1) භූමිකම්පා, ලැව්ගිනි, වාතය හා ජලය දූෂණය වීම
2) ගිනිකඳු පිපිරීම, කාන්තාරීකරණය, භූමිකම්පා
3) සුළි කුණාටු, සුනාමි, අම්ල වැසි ඇතිවීම
4) සාගර ජල මට්ටම ඉහළ යාම, ඕසෝන් ස්තරය විනාශ වීම, අම්ල වැසි ඇති වීම

34) සමාජ පරිසරය යනුවෙන් අදහස් කෙරෙනුයේ මින් කවරක්ද ?

1) මිනිසා විසින් ගොඩනගන ලද්දකි.
2) මිනිසාගේ මැදිහත්වීමකින් තොරව ඇති වූ සංරචකයකි.
3) භෞතික සංරචකවලින් ගොඩනගන ලද්දකි.
4) භෞතික සංරචක අතර අන්තර් සම්බන්ධතාවලින් ගොඩනගන ලද්දකි.

35) එක්සත් ජාතීන්ගේ සංගමයේ ආරක්ෂක මණ්ඩලය තුළ නිෂේධ බලය හිමි සාමාජික රටවල් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1) ඇමරිකා එක්සත් ජනපදය, ඉතාලිය, ප්‍රංශය, චීනය, සෝවියට් රුසියාව
2) ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, ජර්මනිය, චීනය, සෝවියට් රුසියාව
3) ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, චීනය, ප්‍රංශය, සෝවියට් රුසියාව
4) ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ප්‍රංශය, මහා බ්‍රිතාන්‍යය, සෝවියට් රුසියාව

36) 1972 ශ්‍රී ලංකා ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඇති කළ ප්‍රධාන වෙනස්කමක් වන්නේ මින් කුමක්ද?

1) ප්‍රථම වරට කැබිනට් ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දීම
2) ප්‍රථම වරට මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම
3) අග්‍රාණ්ඩුකාර ධූරයක් ඇති කිරීම
4) අවසාන අභියාචනාධිකරණය ලෙස බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සිලය පිළිගැනීම

37) පහත "අ" තීරුවේ සඳහන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතන "ආ" තීරුවේ ප්‍රකාශ සමග නිවැරදිව ගැලපූ විට අදාළ පිළිතුර ඇතුළත් කාණ්ඩය තෝරන්න.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1) මහා මණ්ඩලය | A) අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම |
| 2) ආරක්ෂක මණ්ඩලය | B) මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කිරීම |
| 3) ලේකම් කාර්යාලය | C) සංවිධානයේ අයවැය ලේඛනය සකස් කිරීම |
| 4) ආර්ථික හා සමාජ මණ්ඩලය | D) එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරිපාලන ආයතනය |

1) A, B, C, D   2) B, A, C, D   3) C, A, D, B   4) D, B, A, C

38) ගැටුම් නිරාකරණය සඳහා විනිසීමේ ක්‍රියාවලියේ ලක්ෂණයක් වන්නේ,

1) විත්තිකරු අධිකරණයෙහි පෙනී සිටිය යුතුය.
2) සාක්ෂි දීම, නඩු ඇසීම අවිධිමත්ව සිදු වේ.
3) අභියාචනා කිරීමට හැකියාවක් නැත.
4) පාර්ශ්ව දෙකටම වාද කිරීම හරස් ප්‍රශ්න ඇසීම සඳහා අයිතියක් නැත.

39) ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා සහ අධිකරණ සේවා කොමිසමේ සභාපති ධූරය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1) අධිකරණ අමාත්‍යතුමා, නීතිපතිතුමා
2) නීතිපතිතුමා, අග්‍රවිනිශ්චයකාරතුමා
3) අග්‍රවිනිශ්චයකාරතුමා, නීතිපතිතුමා
4) අග්‍රවිනිශ්චයකාරතුමා, අධිකරණ අමාත්‍යතුමා

40) "අ" සහ "ආ" තීරු නිවැරදිව ගළපා පිළිතුරට අයත් අක්ෂර කාණ්ඩය නම් කරන්න.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| i) බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත | A - ක්‍රි. ව. 1917 |
| ii) ඇමරිකානු නිදහස් ප්‍රකාශනය | B - ක්‍රි. ව. 1689 |
| iii) රුසියානු විප්ලවය | C - ක්‍රි. ව. 1215 |
| | D - ක්‍රි. ව. 1776 |

1) A, B, C    2) B, C, D    3) B, D, A    4) C, B, D

(ල. 1 × 40 = 40)